## A කොටස- ව්‍යුහගත රචනා
ප්‍රශ්න හතරට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
($g = 10 \text{ N kg}^{-1}$)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

1. දිග $\ell$ වූ සරල අවලම්බයක චලිතය (1) රූපයේ පෙන්වා ඇත.



(1) රූපය

(a) $\ell$ සහ ගුරුත්වජ ත්වරණය $g$ ඇසුරෙන් සරල අවලම්බයේ දෝලන කාලාවර්තය $T$ සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

..........................................................................................

(b) සරල අවලම්බය භාවිත කර, $g$ හි අගය සොයන විද්‍යාගාර පරීක්ෂණයේ දී 0.5 s ක නිරවද්‍යතාවකින් කාලය මැනිය හැකි විරාම ඝටිකාවක් ඔබට සපයා ඇත. $T$ දෝලන කාලාවර්තයෙහි නිමානිත අගය 2 s නම්, $T$ හි ප්‍රතිශත දෝෂය 1% දක්වා අඩු කර ගැනීමට ඔබ විසින් ගත යුතු අවම දෝලන සංඛ්‍යාව නිර්ණය කරන්න.

..........................................................................................

..........................................................................................

(c) 'අනාවරක පද්ධතියක්' භාවිත කර, දෝලන කාලාවර්තය $T$ වඩාත් නිවැරදි ව නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයකු විසින් විද්‍යුත් ක්‍රමයක් සැලසුම් කරන ලදී.



(2)(a) රූපය


(2)(b) රූපය

අනාවරක පද්ධතිය ප්‍රභව දියෝඩයකින් සහ අනාවරක දියෝඩයකින් සමන්විත වේ. ප්‍රභව දියෝඩය නියත $I_0$ තීව්‍රතාවකින් යුත් පටු අධෝරක්ත (IR) ආලෝක කදම්බයක් නිකුත් කරයි. අනාවරක දියෝඩය මගින් මෙම ආලෝක කදම්බය අනාවරණය කරනු ලබන අතර එමගින් කදම්බයේ තීව්‍රතාව ද මනිනු ලබයි [(2)(a) රූපය බලන්න]. අනාවරක පද්ධතිය සරල අවලම්බයේ බට්ටාගේ පථයෙහි තබා ඇත. දෝලනය වන අතරතුර බට්ටා IR කදම්බය හරහා ද ගමන් කරයි [(2)(b) රූපය බලන්න]. බට්ටා IR කදම්බය අවහිර කරන සෑම විටක දී ම අනාවරක දියෝඩ සංඥාව ශූන්‍ය වන අතර, එසේ නො වන විට $I_0$ නියත තීව්‍රතාවකින් යුත් සංඥාවක් ලබා දෙයි. බට්ටා දෝලනය වන විට කාලය ($t$) සමග අනාවරක සංඥාවේ තීව්‍රතාව ($I$) හි විචලනයේ ප්‍රස්තාරයක් පරිගණක තිරය මත දිස්වේ.



(3) රූපය

(3) රූපයේ පෙන්වා ඇත්තේ පරිගණක තිරය මත දිස්වූ එවැනි ප්‍රස්තාරයක් වන අතර එය ලබා ගෙන ඇත්තේ **වාත රෝධය** නිසා ඇති කරන බලය **නොගිණිය හැකි** අවස්ථාවක දී ය. ශූන්‍ය අනාවරක සංඥාවට අදාළ කාල අන්තරය $t_0$ වේ (රූපය බලන්න).

(i) $t_0$ හි අගය, බට්ටා IR කදම්බය හරහා ගමන් කරන වේගය $v$ සහ බට්ටාගේ විෂ්කම්භය $D$ මත රඳා පවතී. (1) $v$ වැඩි කළ විට (2) $D$ වැඩි කළ විට, $t_0$ හි අගයට කුමක් සිදු වේ ද?

(1) $v$ ට අදාළ ව : ..........................................................................................

(2) $D$ ට අදාළ ව : ..........................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ii) $\upsilon$ නිමානය කිරීම සඳහා ප්‍රකාශනයක් $D$ සහ $t_0$ ඇසුරෙන් ලියා දක්වන්න.

..............................................................................................................

(iii) ඉහත (3) රූපයේ දී ඇති ප්‍රස්තාරයට අනුව $T$ හි අගය කුමක් ද?

..............................................................................................................

($d$) බට්ටාගේ **උපරිම වේගය** $\upsilon_m$ නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයා විසින් අනාවරක පද්ධතිය බට්ටාගේ ගමන් මාර්ගයේ වඩාත් ම සුදුසු ස්ථානයේ තබා (3) රූපයේ පෙන්වා ඇති ප්‍රස්තාරයට සමාන ප්‍රස්තාරයක් ලබා ගන්නා ලදී.

(i) ඉහත (1) රූප සටහනට අනුව, $\upsilon_m$ නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයා අනාවරක පද්ධතිය කුමන ස්ථානයක ($A$ හෝ $B$) තැබිය යුතු දැ'යි සඳහන් කරන්න. ඔබේ තේරීමට හේතුවක් දෙන්න.

..............................................................................................................

..............................................................................................................

(ii) මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා (4)($a$) රූපයෙහි පෙන්වා ඇති සිලින්ඩරාකාර බට්ටා, (4)($b$) රූපයෙහි පෙන්වා ඇති ගෝලාකාර බට්ටාට වඩා සුදුසු බව ශිෂ්‍යයා පවසයි. බට්ටන්ට එක ම $D$ විෂ්කම්භයක් ඇත්නම්, ඔහුගේ ප්‍රකාශය සනාථ කිරීමට හේතුවක් දෙන්න.




(4)($a$) රූපය (4)($b$) රූපය

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(iii) ඉහත සඳහන් කළ ප්‍රස්තාරය සහ ($c$) (ii) හි ප්‍රකාශනය භාවිත කර $\upsilon_m$ හි අගය ගණනය කිරීමට ශිෂ්‍යයා තීරණය කළේ ය. ඔහුට මෙම ක්‍රමය මඟින්, $\upsilon_m$ සඳහා **නිශ්චිත** අගය ලබා ගත හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

..............................................................................................................

..............................................................................................................

($e$) වාත රෝධය නිසා ඇති වන බලය සැලකිය යුතු තරම් වූ අවස්ථාවක ශිෂ්‍යයා, ඔහු ලබා ගත් උපරිම වේගය $\upsilon_m$ දෝලනයෙන් දෝලනයට සැලකිය යුතු ලෙස අඩු වී අවසානයේ බට්ටා නිශ්චල වන බව නිරීක්ෂණය කරන ලදී.

(i) මෙවැනි අවස්ථාවක් සඳහා, ඔබ බලාපොරොත්තු වන ($t$) සමග ($I$) ප්‍රස්තාරය, පහත දී ඇති රූපයේ $T$ කාලයක් සඳහා සම්පූර්ණ කරන්න.




(ii) $t = 0$ හි දී සහ $t = T$ හි දී බට්ටාගේ උපරිම වේගයන් පිළිවෙළින් $0.44\ \mathrm{m\,s^{-1}}$ සහ $0.42\ \mathrm{m\,s^{-1}}$ නම්, වාත රෝධය නිසා $t = 0$ සිට $t = T$ කාලය තුළ අවලම්බයේ ශක්ති හානිය නිමානය කරන්න. බට්ටාගේ ස්කන්ධය 100 g වේ.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

[හතරවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**2.2.2** II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| ⋆ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර **2, 3, 4.1, 4.2** හා **4.3** ඇසුරෙන් සකස් කර ඇත. |

## A කොටස - ව්‍යුහගත රචනා

**1.** දිග $\ell$ වූ සරල අවලම්බයක චලිතය (1) රූපයේ පෙන්වා ඇත.




(1) රූපය

(*a*) $\ell$ සහ ගුරුත්වජ ත්වරණය $g$ ඇසුරෙන් සරල අවලම්බයේ දෝලන කාලාවර්තය $T$ සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

$T = 2\pi\sqrt{\frac{l}{g}}$ .................................................................... **(ලකුණු 01)**

(*b*) සරල අවලම්බය භාවිත කර, $g$ හි අගය සොයන විද්‍යාගාර පරීක්ෂණයේ දී $0.5\,s$ ක නිරවද්‍යතාවකින් කාලය මැනිය හැකි විරාම ඝටිකාවක් ඔබට සපයා ඇත. $T$ දෝලන කාලාවර්තයෙහි නිමානිත අගය $2\,s$ නම්, $T$ හි ප්‍රතිශත දෝෂය $1\%$ දක්වා අඩු කර ගැනීමට ඔබ විසින් ගත යුතු අවම දෝලන සංඛ්‍යාව නිර්ණය කරන්න.

$$\frac{\Delta T}{T} = \frac{(0.5/n)}{2} = \frac{1}{100}$$

$$n = 25$$

**(ලකුණු 01)**

$$T = \frac{t}{n} \rightarrow \frac{\Delta T}{T} = \frac{\Delta t}{t} = \frac{\Delta t}{nT} = \frac{(0.5)}{n \times 2} = \frac{1}{100}$$

(*c*) 'අනාවරක පද්ධතියක්' භාවිත කර, දෝලන කාලාවර්තය $T$ වඩාත් නිවැරදි ව නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයකු විසින් විද්‍යුත් ක්‍රමයක් සැලසුම් කරන ලදී.




(2)(*a*) රූපය



(2)(*b*) රූපය

අනාවරක පද්ධතිය ප්‍රභව දියෝඩයකින් සහ අනාවරක දියෝඩයකින් සමන්විත වේ. ප්‍රභව දියෝඩය නියත $I_0$ තීව්‍රතාවකින් යුත් පටු අධෝරක්ත (IR) ආලෝක කදම්බයක් නිකුත් කරයි. අනාවරක දියෝඩය මගින් මෙම ආලෝක කදම්බය අනාවරණය කරනු ලබන අතර එමගින් කදම්බයේ තීව්‍රතාව ද මනිනු ලබයි [(2)(*a*) රූපය බලන්න]. අනාවරක පද්ධතිය සරල අවලම්බයේ බට්ටාගේ පථයෙහි තබා ඇත. දෝලනය වන අතරතුර බට්ටා IR කදම්බය හරහා ද ගමන් කරයි [(2)(*b*) රූපය බලන්න]. බට්ටා IR කදම්බය අවහිර කරන සෑම විටක දී ම අනාවරක දියෝඩ සංඥාව ශූන්‍ය වන අතර, එසේ නො වන විට $I_0$ නියත තීව්‍රතාවකින් යුත් සංඥාවක් ලබා දෙයි. බට්ටා දෝලනය වන විට කාලය ($t$) සමග අනාවරක සංඥාවේ තීව්‍රතාව ($I$) හි විචලනයේ ප්‍රස්තාරයක් පරිගණක තිරය මත දිස්වේ.




(3) රූපය

(3) රූපයේ පෙන්වා ඇත්තේ පරිගණක තිරය මත දිස්වූ එවැනි ප්‍රස්තාරයක් වන අතර එය ලබා ගෙන ඇත්තේ **වාත රෝධය** නිසා ඇති කරන බලය **නොගිනිය හැකි** අවස්ථාවක දී ය. ශුන්‍ය අනාවරක සංඥාවට අදාළ කාල අන්තරය $t_0$ වේ (රූපය බලන්න).

(i) $t_0$ හි අගය, බට්ටා IR කදම්බය හරහා ගමන් කරන වේගය $v$ සහ බට්ටාගේ විෂ්කම්භය $D$ මත රඳා පවතී. (1) $v$ වැඩි කළ විට (2) $D$ වැඩි කළ විට, $t_0$ හි අගයට කුමක් සිදු වේ ද?

(1) $v$ ට අදාළව : $t_0$ හි අගය අඩු වේ.

(2) $D$ ට අදාළ ව : $t_0$ හි අගය වැඩි වේ.

ඕනෑම එක් නිවැරදි පිළිතුරක් සඳහා .................................................... **(ලකුණු 01)**

(ii) $v$ නිර්ණය කිරීම සඳහා ප්‍රකාශනයක් $D$ සහ $t_0$ ඇසුරෙන් ලියා දක්වන්න.

$V = \dfrac{D}{t_0}$ $\qquad D = Vt_0$ භාරගන්න **(ලකුණු 01)**

(iii) ඉහත (3) රූපයේ දී ඇති ප්‍රස්තාරයට අනුව $T$ හි අගය කුමක් ද?

$T = 3\text{ s}$ $\qquad$ $s$ අනවශ්‍ය ය. **(ලකුණු 01)**

($d$) බට්ටාගේ **උපරිම වේගය** $v_m$ නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයා විසින් අනාවරක පද්ධතිය බට්ටාගේ ගමන් මාර්ගයේ වඩාත් ම සුදුසු ස්ථානයේ තබා (3) රූපයේ පෙන්වා ඇති ප්‍රස්තාරයට සමාන ප්‍රස්තාරයක් ලබා ගන්නා ලදී.

(i) ඉහත (1) රූප සටහනට අනුව, $v_m$ නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයා අනාවරක පද්ධතිය කුමන ස්ථානයක ($A$ හෝ $B$) තැබිය යුතු දැ'යි සඳහන් කරන්න. ඔබේ තේරීමට හේතුවක් දෙන්න.

පිළිතුර : $A$

හේතුව : $A$ ලක්ෂයේදී/ පථයේ පහළ ම ලක්ෂයේ දී අවලම්බ බට්ටාට **උපරිම** වේගයක්/ **උපරිම** ප්‍රවේගයක්/ **උපරිම** චාලක ශක්තියක් ඇත.

පිළිතුර සහ හේතුව යන දෙකම නිවැරදි නම් ......................... **(ලකුණු 01)**

(ii) මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා (4)($a$) රූපයෙහි පෙන්වා ඇති සිලින්ඩරාකාර බට්ටා, (4)($b$) රූපයෙහි පෙන්වා ඇති ගෝලාකාර බට්ටාට වඩා සුදුසු බව ශිෂ්‍යයා පවසයි. බට්ටන්ට එක ම $D$ විෂ්කම්භයක් ඇත්නම්, ඔහුගේ ප්‍රකාශය සනාථ කිරීමට හේතුවක් දෙන්න.



(4)($a$) රූපය



(4)($b$) රූපය

$IR$ කදම්බය ඇසට **නොපෙනෙන** නිසා කදම්භය, විශ්කම්භය/ $D$ හරහා **එක** එල්ලේ යොමු **කිරීමට** අපහසුය **හෝ**

කදම්බය ගෝලාකාර බට්ටාගේ විශ්කම්භය/ $D$ හරහා එක එල්ලේ යොමු කිරීමට පහසුය **හෝ**

සිලින්ඩරාකාර බට්ටාගේ ඕනෑම හරස්කඩක් හරහා ම විශ්කම්භය/ $D$ නියත වේ හෝ ගෝලාකාර බට්ටාගේ විශ්කම්භය $D$ වනුයේ එක් ස්ථානයකදී පමණි **හෝ**

සිලින්ඩරාකාර බට්ටා භාවිත කිරීමෙන් $v$ හි දෝශය අඩු කළ හැකිය **හෝ**

ගෝලාකාර බට්ටා මගින් කදම්බය අවහිර කරන දුර $D$ වනුයේ එක් ස්ථානයකදී පමණි **හෝ**

සිලින්ඩරාකාර බට්ටා මගින් කදම්බය අවහිර කරන බට්ටගේ ඕනෑම හරස්කඩක් හරහා ම $D$ වේ.

(ඕනෑම එක් නිවැරදි හේතුවක් සඳහා) ......................... **(ලකුණු 01)**

(iii) ඉහත සඳහන් කළ ප්‍රස්තාරය සහ (*c*) (ii) හි ප්‍රකාශනය භාවිත කර $v_m$ හි අගය ගණනය කිරීමට ශිෂ්‍යයා තීරණය කළේ ය. ඔහුට මෙම ක්‍රමය මගින්, $v_m$ සඳහා **නිශ්චිත** අගය ලබා ගත හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

පිළිතුර : නොහැකිය ........................................................... **(ලකුණු 01)**

(හේතුව : $v_m$ පථයේ පහළ ම ලක්ෂයේ දී ක්ෂණික වේගය යි/ ගණනය කරන ලද අගය සාමාන්‍ය/ ආසන්න අගයකි.)

(*e*) වාත රෝධය නිසා ඇති වන බලය සැලකිය යුතු තරම් වූ අවස්ථාවක ශිෂ්‍යයා, ඔහු ලබා ගත් උපරිම වේගය $v_m$ දෝලනයෙන් දෝලනයට සැලකිය යුතු ලෙස අඩු වී අවසානයේ බට්ටා නිශ්චල වන බව නිරීක්ෂණය කරන ලදී.

(i) මෙවැනි අවස්ථාවක් සඳහා, ඔබ බලාපොරොත්තු වන ($t$) සමඟ ($I$) ප්‍රස්තාරය, පහත දී ඇති රූපයේ $T$ කාලයක් සඳහා සම්පූර්ණ කරන්න.




**($I_0$ නියත නොවුව ද ඒවා නොසලකා ලකුණු ලබා දෙන්න.)**

........................ **(ලකුණු 01)**

(ශුන්‍ය තීව්‍රතාවයේ පළල කාලය සමග වැඩි විය යුතුය. $t$ අක්ෂය මත සලකුණු කිරීම් අවශ්‍ය නොවේ. **අඩුම තරමින් තවත් එක්** ශුන්‍ය තීව්‍රතා ප්‍රදේශයක් වත් පැහැදිලිව ඇඳ තිබිය යුතුය. තීව්‍රතා මට්ටමේ වෙනස් වීම නොසලකා හරින්න)

(ii) $t = 0$ හි දී සහ $t = T$ හි දී බට්ටාගේ උපරිම වේගයන් පිළිවෙළින් $0.44\ \text{m s}^{-1}$ සහ $0.42\ \text{m s}^{-1}$ නම්, වාත රෝධය නිසා $t = 0$ සිට $t = T$ කාලය තුළ අවලම්බයේ ශක්ති හානිය නිර්ණය කරන්න. බට්ටාගේ ස්කන්ධය 100 g වේ.

$$\text{ශක්ති හානිය} = \frac{1}{2}\ (0.1)\ (0.44^2 - 0.42^2) = 8.6 \times 10^{-4}\ \text{J}$$ ............... **(ලකුණු 01)**

(නිවැරදි ආදේශය සඳහා හෝ අවසාන පිළිතුර සඳහා)